අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.


මගේ යොමුව / எனது குறியீடு / My Ref.: PTF/01/Gen/01

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.:

දිනය / திகதி / Date: 2020.05.20

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ රු.5000/-ක දීමනාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අභියාචනා සලකා බැලීම</u>**

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2020.05.18 දින අරලියගහ මන්දිරයේ පැවැති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ රැස්වීමේ දී, උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා ජනතාවට සහන සැලසීම උදෙසා ක්‍රියාත්මක වූ සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ රු.5000/-ක දීමනාව ලබා ගැනීමට මූලික සුදුසුකම් සපුරා ඇති පවුල් ඒකක හා පුද්ගලයින්ට එම දීමනාව ගෙවීමේ කටයුතු සාර්ථකව සිදු වන බවට කරුණු අනාවරණය විය.

02. එහෙත්, ඉහත රැස්වීමේ දී දිස්ත්‍රික් ලේකම්වරුන් පෙන්වා දුන්නේ මෙතෙක් ලැබී ඇති අභියාචනාවලින් රු.5000/-ක දීමනාව ලැබීමට සුදුසු පුද්ගලයින් තේරීමේ දී සමහර පවුල් ඒකක හා පුද්ගලයින් පළමු අවස්ථාවේ දී මගහැරී තිබූ නිසා එසේ මගහැරී තිබූ පවුල් ඒකක හෝ පුද්ගලයින් ව මෙතෙක් ලැබී ඇති අභියාචනා මත තෝරා ගැනීමට ඔවුනට අවස්ථාවක් ලබා දෙන ලෙසයි.

03. ඒ අනුව, ජනාධිපති කාර්යසාධන බලකායට හෝ දිස්ත්‍රික් ලේකම්වරුන්ට හෝ ප්‍රාදේශීය ලේකම්වරුන්ට මේ දක්වා ඉදිරිපත් කර තිබූ අභියාචනා අතුරින් අත්‍යාවශයයෙන්ම එම දීමනාව ලැබිය යුතු යම් පවුල් ඒකකයක් හෝ පුද්ගලයෙකු එසේ මගහැරී ඇති බවට තහවුරු වන්නේ නම් අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව රු.5000/-ක දීමනාව ගෙවීමට තීරණය කරන ලදී.

04. එහිදී, අභියාචනා ඉදිරිපත් කළ පුද්ගලයින් කාර්යාල වෙත නොකැඳවා, තෝරාගනු ලබන පවුල් ඒකකවල හා පුද්ගලයින්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එම දීමනාව ලැබීමට සුදුස්සන් ලෙස තෝරාගනු ලබන පවුල් ඒකක සඳහා අප්‍රේල් සහ මැයි මාස සඳහා අදාළ දීමනාව මැයි මස දී එකවර ගෙවීමට කටයුතු කළ යුතු ය.

05. 2020.05.27 දින වනවිට දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් එම අභියාචනා පිළිබඳව අවසන් තීරණය ලබා දී ගෙවීම් කටයුතු නිම කළ යුතු වේ.

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

**පිටපත්:**

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති

(1–3) කාරුණික දැනගැනීම සඳහා

4. ලේකම් - මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම් - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම් - කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

(4–6) අවශ්‍ය කටයුතු සඳහා